**Lawyers Beyond Borders - Sri Lanka**
**No: 867, Ethul Kotte, Kotte.**
**T.P: +94 777324062**

# <u>මාධ්‍ය නිවේදනයයි</u>.

පකිස්තානයේ, සියල්කොට් නගරයේ ඇඟළුම් කර්මාන්ත ශාලාවක කලමණාකරුවකු ලෙස සේවය කළ ශ්‍රී ලාංකික ශ්‍රමිකයකු පසුගිය දෙසැම්බර් 02 වෙනි දින අමානුෂික අන්දමින් ඝාතනය කර පුළුස්සා දැමීම ඉතාමත් ම්ලේච්ඡ සහ බියගුළු ක්‍රියාවක් ලෙස සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්ගෙන් සැදුම් ලත් Lawyers Beyond Borders-Sri Lanka (LBB -Sri Lanka) (ලෝයර්ස් බියොන්ඩ් බෝඩර්ස් - ශ්‍රී ලංකා) සංවිධානයේ සාමාජිකත්වය එය පිළිකුළෙන් යුතුව හෙළා දකී.

විශේෂයෙන්ම, ජාත්‍යාන්තර මානව හිමිකම් දිනය සහ අන්තර්ජාතික සංක්‍රමණික දිනය යන සංක්‍රමණික ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ජාත්‍යාන්තර වශයෙන් පිළිගත් දිනයන් යෙදී ඇති දෙසැම්බර් මාසය තුළ, කිසිදු ආයුරකින් මානුෂීය යැයි කිව නොහැකි, සදාචාරාත්මක නොවන ලෙසින් සිදුකරන ලද ඝාතනයක් ලෙස මෙම සිදුවීම පෙන්වා දිය හැක.

වරදකරුවකු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මෙන්ම මානව හිමිකම් විශ්ව ප්‍රඥප්තිය තුළ පවා ඉතා පැහැදිලිව වගන්ති දක්වා තිබේ. බොහෝ රටවල මෙන්ම කලාපීය හා අන්තර්ජාතික සම්මුතීන් තුළින් පුද්ගලයාගේ ශරීරයට සිදුකරනු ලබන වද හිංසා පිළිබඳවත්, එලෙස පුද්ගලයන් වද හිංසාවට ලක් නොකළ යුතු හා එකී වද හිංසා බැහැර කිරීම පිළිබඳවත් පුළුල්ව අර්ථකථනය කොට ඇත. එලෙස ජාතික හා ජාත්‍යාන්තර වශයෙන් නීති රීති ගෙනහැර දක්වා ඇත්තේ වරදකරුවකු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව මානව හිතවාදීව අර්ථ දැක්වීම සඳහා ය. එහිදී ,කිසිදු පුද්ගලයකු අධිකරණ ක්‍රමවේදයෙන් බැහැරව වරදකරුවකු කර දඬුවම් කිරීමට කිසිවකුට අයිතියක් නොමැත.

තාක්ෂණය මෙන්ම සන්නිවේදන ක්‍රමවේදයන් වර්ධනය වීමත් සමඟ, දියුණු මනසක් ඇති, දැනුවත් සමාජය තුළ ජීවත්වන මිනිසුන් ලෙස මීට සියවස් ගණනකට ඉහතදී තිබූ වහල් සමාජයක මෙන් එකිනෙකාගේ අයිතීන් පාගා දමමින් ක්‍රියාත්මක වීමට ශ්‍රමික අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යාන්තරව පිළිගත් නීති රීති, සම්මුතීන් රැසක් ක්‍රියාත්මක වන වකවානුවක කිසිදු රාජ්‍යයක් ඉඩප්‍රස්ථාවක් නොදිය යුතු බව පෙන්වා දීමට කැමැත්තෙමු.

සංක්‍රමණික ශ්‍රමිකයින් සම්බන්ධයෙන් ගොඩනඟා ඇති සාක් සම්මුතීන් තුළ බැඳී සිටින තත්ත්වයක, පකිස්තානය වැනි අසල්වැසි රාජ්‍යයක වෙසෙන ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයකු අමානුෂික ආකාරයේ වද හිංසාවන්ට ලක්කර මහමඟදී විශාල පිරිසක් ඒකරාශී වී, පහරදී ඝාතනය කොට පුළුස්සා දැමීම පෙන්නුම් කරන්නේ තවදුරටත් මානව හිමිකම් ආරක්ෂා කිරීමේ පුළුල් වැයම අඩපණ කිරීමේ නිහීන උත්සාහයක් ලෙසටය. ඕනෑම රාජ්‍යක් සිය පුරවැසියන්ගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරන ආකාරයටම ස්වකීය රට තුළ සේවය කරන සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්ද සමාන හා පූර්ණ වගකීමකින් යුක්තව කටයුතු කළ යුතු බව මේ සිදුවීම තවදුරටත් පසක් කර සිටී.

සෑම රටක්ම තම රටේ පුරවැසියන්ගේ ශ්‍රමික අයිතිවාසිකම් ව්‍යවස්ථාපිතව තහවුරු කර තිබුනද ඒ රටවල සේවය කරන සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව ඒ හා සමාන ව්‍යවස්ථාපිත අයිතීන් තහවුරු කිරීම් සකස් වී නොමැති වීම බලවත් අඩුපාඩුවකි. මෙහිදී ලෝක කම්කරු සංවිධානයට ඒ සම්බන්ධයෙන් වැදගත් සහ භාරධූර වගකීමක් මෙන්ම කාර්යභාරයක් පැවරෙනු ඇත. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් බැඳී සිටින නීතිඥවරුන්ගෙන් සැදුම්ලත් අප සංවිධානය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා මෙලෙස දක්වනු කැමැත්තෙමු.

- ඝාතනයට ලක් වූ ශ්‍රී ලාංකික කලමණාකරු සම්බන්ධයෙන් පකිස්තානු රජය  පූර්ණ හා අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ යුතු අතර ඊට අදාළ සියළුම චූදිතයන් අධිකරණය හමුවට පමුණුවා නීතිය ක්‍රියාත්මක කළ යුතුය.

- රාජ්‍යයන් අතර තිබෙන සංක්‍රමණික ශ්‍රමිකයින් පිළිබඳ ද්වි පාර්ශවික ගිවිසුම් සකස් කිරීමේදී එකී ශ්‍රමිකයින්ගේ ජීවිත සුරක්ෂිතතාව සම්බන්ධ වගන්තීන්ද ඇතුළත් කරමින් එකී ගිවිසුම් කඩිනමින් යාවත්කාලීන කළ යුතුය.
- සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ කම්කරු අයිතිවාසිකම් සේම ශාරීරික අයිතිවාසිකම්ද සුරක්ෂිත කොට තහවුරු කිරීම සඳහා අවශ්‍ය නව නීති සම්පාදන කිරීම සඳහා එලෙස සංක්‍රමණික ශ්‍රමිකයින් ගෙන්වා ගනු ලබන රාජ්‍යයන් විසින් සිදු කළ යුතුය.
- ශ්‍රී ලංකා රජය මෙම ඝාතනය සම්බන්ධයෙන් ක්ෂණිකව මැදිහත් වී පකිස්තානු රජය සමඟ සාකච්ඡා කොට, එරට සිටින අනෙකුත් ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ ජීවිත සුරක්ෂිතතාව තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ක්‍රියාමාර්ගයකට අවතීරණය විය යුතුය.
- ඝාතනයට ලක් වූ ශ්‍රී ලාංකියාගේ මරණය සම්බන්ධයෙන් ඔහුගේ පවුලේ අයට ලබා ගත හැකි උපරිම වන්දි මුදල් ලබා දීමට ක්‍රියාකළ යුතුය.

නීතිඥ සුජීව ලාල් දහනායක,

ජාතික සම්බන්ධීකාරක,

Lawyers Beyond Borders - Sri Lanka (ලෝයර්ස් බියොන්ඩ් බෝඩර්ස් - ශ්‍රී ලංකා)